KIDS GOD WORSHIP
www.kidworship.kr

# වැන්දඹුවගේ පඬුර

–The Widow's offering–



97Page

**පොතේ ගුරා** දවසක්දා යේසුස්වහන්සේ සහ ගෝලයන් දේවමාළිගාවට ගියා. දේ-වමාළිගාවට එන ජනතාව පඬුරු දමන ආකාරය, පූජාවන් දමන ස්ථානයට ඉදිරියෙන් සිටි යේසුස්වහන්සේ බලාගෙන සිටියා. ඒ ජනතාව අතුරින් එක්තරා ධනවත් මිනිසෙක් පැමිණ,

**ධනවත් මිනිසා** ආහ් ... මේක බරයි නේ?

**පොතේ ගුරා** ධනවත් මිනිසා ඔහුගේ මුදල් බෑගය හැර හැමදෙනාටම පෙනෙන්න මුදල් එළියට ගන්නවා. එයින් කොටසක් රැගෙන එය පූජාවට දමනවා. ඔහු ලොකු මුදලක් දේවමාළිගාවේ භාණ්ඩාගාරයට දැම්මට පසුව මිනිසුන් ඒ ගැන රහසින් කුටු කුටු ගාන්න පටන් ගත්තා.

**පළමු මිනිසා** ඒ අරයා දිහා බලන්න. එයාට ඇත්තටම ගොඩක් සල්ලි තියෙනවා.

**දෙවන මිනිසා** බලන්න එයා දේවමාළිගාවේ භාණ්ඩාගාරයට දැම්ම මුදල් දිහා. එයාගේ විශ්වාසය ගොඩක් ශක්තිමත් වෙන්න ඕන.

**පළමු මිනිසා** ඔයා හරි... එයා දුන්න පඬුරුවල ප්‍රමාණයට, දෙවියන්වහන්සේ එයාට ගොඩක් ආශීර්වාද කරයි.

.................................................................................................



98Page

**පොතේ ගුරා** ඒ ධනවත් මිනිසා ගියාට පසුව දුප්පත් වැන්දඹුවක්, පරණ ඇඳුම් හැඳ දේව මාළිගාවේ පඬුරු-පූජාවන් දමන ස්ථානයට එනවා. බොහෝ පිරිසක් ඒ ස්ථානයේ සිටියත් කිසිවෙක් ඇයව ගණන්ගත්තේ නෑ.

**වැන්දඹුව** මට තියෙන්නේ මුදල් මෙපමණයි. ඒ වුණාට මම සතුටු වෙනවා. මට කීයක් හරි උන්වහන්සේ දීලා තියෙනවා, පඬුරු දමන්න, ඒ ගැන මම දෙවියන්-වහන්සේට ස්තුති කරනවා.

**පොතේ ගුරා** වැන්දඹුව එයාගේ තඹ කාසි දෙක දේවමාළිගයේ භාණ්ඩාගාරයට දැම්මා. ඇයගේ මේ මුදලේ වටිනාකම, රු. 30ක් පමණ (ශ්‍රී ලංකා මුදලින්). ගොඩක් පොඩි මුදලක්..

.................................................................................................



99Page

ස්ලිංංං ස්ලිංංං ස්ලිංංං (මුදල් වැටෙන ශබ්දය).

**පොතේ ගුරා** දේවමාළිගයේ භාණ්ඩාගාරය ඇතුළේ කාසි වැටෙන සද්දය මිනිසුන්ට ඇසුණාම, ඔවුන් හිනාවෙන්න පටන් ගත්තා.

**පළමු මිනිසා** ජ්ච්... ජ්ච්... ච්... ඔයා ඔය තරම් සුළු මුදලක් දෙවියන්වහන්සේට දුන්නේ කොහොමද?

**දෙවන මිනිසා** ම්ම්... එයා විශ්වාසය බොහොම ටිකයි.

**පළමු මිනිසා** මම නම් ගොඩක් මුදල් උපයාගෙන, අර ධනවත් මිනිසා වගේ ලොකු දීමනවාක් දෙවියන්වහන්සේට දෙනවා.

**පොතේ ගුරා** නිසොල්මන්ව මේ සියල්ලම දෙස එක්කෙනෙක් බලා සිටිනවා. ඔව්, ඒ යේසුස්වහන්සේ. යේසුස්වහන්සේ ගෝලයන්ට මෙහෙම කිව්වා.



100Page



101Page

**යේසුස්වහන්සේ** අර ධනවත් මිනිසාට වඩා, මේ දුප්පත් වැන්දඹුව, දේවමාළිගයේ භාණ්ඩාගාරයට පූජාව වැඩියෙන් දුන්නා.

**ගෝලයා** යේසුනි, ඔබවහන්සේ මෙයින් තේරුම් කරන්නේ මොකක්ද? ඒ ධනවත් මිනිසා ලොකු පඩුරක් දෙවියන්වහන්සේට දුන්නා. ඒත් මේ වැන්දඹු ස්ත්‍රිය තඹ කාසි දෙකක් විතරයි දුන්නේ.

**යේසුස්වහන්සේ** ඒ ධනවත් මිනිසා එයාගේ මුළු ධනවත්කමින් ගත් එක්තරා කොටසක් පමණයි දුන්නේ. ඒත් මේ වැන්දඹුව එයාගේ දුප්පත්කමින් එයාට ජී-වත්වෙන්න තිබුණු සියල්ලම දුන්නා.

..........................................................................................

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ අපගේ පිටස්තර පෙනුම දෙස බලන්නේ නෑ.
උන්වහන්සේ අප කොපමණ පඩුරු දමන්නේද කියා බලන්නෙත් නෑ. අපි උන්වහන්සේ
කොපමණක් ආදරෙයිද? දෙවියන්වහන්සේට වැදගත් වෙන්නේ ඒකයි.
ඇත්තටම අපි උන්වහන්සේට කොපමණ ආදරෙයිද?

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, අපි ඇඳුම්,පැළඳුම්, කෑමබීම, මොස්තරවලට ගොඩක් මුදල් වියදම් කරනවා නේද? ඒත් සම්මාදම් පූජාව හරිම පොඩි එකක් නේද? මේ දෙක
හොඳින් සිතා බලන්න, ඊළඟට යේසුස්වහන්සේට මුදල් දෙනවිට හරියට දෙන්න.
උන්වහන්සේ සතුටින් එයා භාරගනි.